**කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර.**

**දෙවන වාර ඇගයීම - 2018**

**පුරවැසි අධ්‍යාපනය I-II**

**7 ශ්‍රේණිය**

**කාලය පැය 02**

**සැලකිය යුතුයි.**

**(i) I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) II කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය බැවින් එම ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.**

I කොටස

1. සමාජයේ මූලික තැනුම් ඒකකය ලෙස සැලකෙන්නේ,
   1. පවුල
   2. පාසල
   3. මිතුරු කණ්ඩායම්
   4. ආගමික ආයතන

2. සමාජයක් නිර්මාණය වීමට අවශ්‍ය මූලික කරුණු වන්නේ,
   1. පුද්ගලයන්ය.
   2. පුද්ගලයන් එකතු වී සිටීමය.
   3. දිගු කාලයක් එක්ව කටයුතු කිරීමය.
   4. පුද්ගල අන්තර් ක්‍රියා පැවතීම හා දිගු කලක් එක්ව වාසය කිරීමයි.

3. න්‍යෂ්ඨික පවුල් ව්‍යාප්ත වීමට බලපෑ කරුණ කවරේද?
   1. ග්‍රාමීය සමාජයේ සිදුවන වෙනස්කම්ය
   2. නගර හා උප නගර බිහිවීමය.
   3. ආර්ථික අපහසුතාය
   4. ඉහත කරුණු සියල්ලය.

4. විස්තෘත පවුලට අයත් සාමාජිකයන් වන්නේ,
   1. මව පියා පමණි.
   2. මව, පියා හා දරුවන් පමණි.
   3. මව පියා දරුවන් හා මව් පස ඥාතීන් පමණි
   4. මව, පියා දරුවන් හා මව්පස හා පියපස ඥාතීන්ය

5. පවුලේ සාමජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු ගුණාංගයක් වනුයේ,
   1. තරගකාරීව කටයුතු කිරීම.
   2. තමන්ගේ දියුණුව පමණක් සිතා කටයුතු කිරීම.
   3. තනිව තීරණ ගැනීම.
   4. පවුලේ දියුණුව වෙනුවෙන් කැපවීම.

6. පුද්ගලයෙකුගේ හා සමාජයේ සංවර්ධනයට හේතු වන හිතකර බලවේගයක් නොවන්නේ,
   1. කල්‍යාණ මිත්‍රයන්
   2. හරවත් පුවත්පත්
   3. වෙළඳ ප්‍රචාරක දැන්වීම්
   4. කියවීම් ශාලා.

7. අහිතකර සමාජ බලවේගවලට ගොදුරු වීම නිසා පුද්ගලයාට අත්විඳීමට සිදුවන ප්‍රතිවිපාක අතුරෙන් ප්‍රධාන වනුයේ,
    1. පුද්ගලයාගේ ජීවිතය පරිහානිය කරා යොමු වීම
    2. රටේ දේපල විනාශ වීම.
    3. ආර්ථික අපහසුතාවලට මුහුණ දීමට සිදු වීම
    4. සමාජයෙන් අවමන් විඳීමට සිදුවීම.

8. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල හා ක්‍රීඩාවේ නිරත වීමෙන්,
    1. ගත හා සිත සංවර බවට පත් වේ.
    2. විනෝදයෙන් කාලය ගත කිරීමට හැකි වේ.
    3. මුදල් උපයා ගැනිමට හැකි වේ.
    4. රටේ ප්‍රසිද්ධ පුද්ගලයෙකු බවට පත්වීමට හැකි වේ.

9. පවුලේ සාමාජිකයන් අතර සුහදත්වය වර්ධනය කර ගැනීමට උපකාරී වන ක්‍රියාකාරකමක් වනුයේ,
    1. සියලු දෙනා එක්වී නිවසේ කාර්යන් ඉටු කිරීම.
    2. එක්ව ආහාර ගැනීම.
    3. ක්‍රීඩාවේ හා  ගීත ගායනයේ නිරත වීම.
    4. ඉහත කරුණු සියල්ලම.

10. පුද්ගලයා වෙත මුහුණ දීමට සිදුවන විවිධ ජීවන අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට නම්,
    1. ඉක්මන් තීරණවලට එළඹිය යුතුය.
    2. ශුභවාදී ආකල්ප ඇති කර ගත යුතුයි.
    3. අභියෝග හමුවේ පසු බා යා යුතුයි.
    4. "ජීවත් වීම යනු අභියෝගවලට මුහුණ දීමය" යන ආකල්පය ඇති කර ගත යුතුය.

11. විචාරශීලි හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස වෙළඳ පොළ සමඟ කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කරුණක් වනුයේ,
    1. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අවධානය යොමු කර භාණ්ඩ තෝරා ගැනීම.
    2. මිල පිළිබඳව සැලකිලිමත් වී භාණ්ඩ තෝරා ගැනීම.
    3. ගුණාත්මක තත්වයෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීම.
    4. අඩු මුදලකට වැඩි භාණ්ඩ ප්‍රමාණයක් මිලට ගැනීමට කටයුතු කිරීම.

12. පවුලේ ආදායම ප්‍රමාණවත් නොවන බැවින් ඔබගේ මව හෝ පියා විදේශගත රැකියාවක නිරතව සිටී නම් දරුවකු ලෙස ඔබගේ ප්‍රධාන කාර්යය විය යුත්තේ,
    1. පවුල වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කරමින් හොඳින් ඉගෙන ගැනීම.
    2. මව හෝ පියා විදේශගතව රැකියා කරමින් එවන මුදල් වලින් සිය අවශ්‍යතා උපරිම ලෙස ඉටු කර ගැනීම.
    3. සුඛෝපභෝගී ජීවිතයකට හුරු වීම.
    4. නවීන මෝස්තර විලාසිතා කෙරෙහි යොමු වීම.

13. පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියකු සතු ගුණාංගයක් විය යුතු වන්නේ,

1. නායකත්වයට ගරු කිරීම.
2. අයිතිවාසිකම් භුක්ති විඳීම.
3. අන් අයගේ උදව් අපේක්ෂාවෙන් කටයුතු කිරීම.
4. තමන්ගේ කාර්යයන් මැනවින් ඉටු කර ගැනීම.

14. පවුලේ සාමාජිකයකු ලෙස හිමිවන අයිතිවාසිකමක් වන්නේ,

1. ආහාර හා පෝෂණය ලැබීම. 2. නායකත්වයට ගරු කිරීම.
3. පවුල සතු දෑ සුරැකීම. 4. පවුලේ ගෞරවය රැක ගැනීම.

15. පවුලේ සාමාජිකයන් අතර කථා බහ කිරීමේදී අනුගමනය කළ යුතු සිරිතකි.

1. නමින් ඇමතීම. 2. නෑකම අනුව ඇමතීම.
3. විශේෂ පද යොදා ගනිමින් ඇමතීම. 4. ඉහත ඕනෑම ආකාරයකින් ඇමතීම.

16. ඔබේ මවගේ වැඩිමහල් සොයුරාගේ බිරිඳට නෑකම අනුව ආමන්ත්‍රණය කළ යුතු පදය කුමක්ද?

1. ලොකු නැන්දා 2. ලොකු අම්මා 3. පුංචි අම්මා 4. කුඩම්මා

17. ඥාතීත්වය අනුව ඔබගේ පියාගේ පියා සීයා නම් සියාගේ පියා ඔබගේ කවරෙක්ද?

1. මුත්තා 2. අත්තා 3. නත්තා 4. කිරි කෑ මුත්තා

18. පවුල තුළ අනුගමනය කරන සිරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් හි ස්වභාවය

1. සංස්කෘතින් අනුව වෙනස් වේ. 2. සෑම ජන කණ්ඩායමකටම පොදු වේ.
3. සෑම පළාතකම එක හා සමාන වේ. 4. අදහන ආගම අනුව තීරණය වේ.

19. අසල් වැසියන් සමග සුහදතා ගොඩනගා ගත යුතු වන්නේ,

1. උදව් උපකාර ලබා ගැනීමටය. 2. මිල මුදල් හා වෙනත් ආධාර ලබා ගැනීමටය
3. ආගිය තොරතුරු කථා කරමින් කල් ඇරිම සඳහාය 4. සුහදතාව වර්ධනය කර ගැනීම සඳහාය.

20. දරුවන් මුල් කරගෙන ඉටු කරනු ලබන චාරිත්‍රයක් නොවන්නේ,

1. ඉඳුල් කට ගෑම 2. අකුරු කියවීම 3. නම් තැබීම 4. ගෙට ගෙවදීම.

## II කොටස

◆ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1. i. පවුල් වර්ග 02 ක නම් කරන්න.
   ii. පවුලට පොදු වූ ලක්‍ෂණ 2 ක් ලියන්න.
   iii. පවුලේ සාමාජිකයෙකු ලෙස ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 2 ක් සඳහන් කරන්න.
   iv. විස්තෘත පවුලක සාමාජිකයෙක් වීම නිසා ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
   v. පවුලෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 02 ක් සඳහන් කරන්න.
   vi. කාල සටහනකට අනුව දිනපතා කටයුතු ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
   vii. හිතකර බලවේගවලට යොමු වීමෙන් ජීවිතයට ළඟා කර ගත හැකි ප්‍රයෝජන 02 ක් ලියන්න.
   viii. පවුලේ සාමාජිකයන් එක්ව කටයුතු කරන අවස්ථා 2 ක් දක්වන්න.
   xi. විවේකය ඵලදායීව ගත කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් 02 ක් ලියන්න.
   x. ඔබේ ඥාතීන් අයත් වන පාර්ශ්ව දෙක කුමක්ද?

(ලකුණු 2x10= 20)

02. i. ජීවන අරමුණක් යනු කුමක්ද? (ලකුණු 02)
   ii. ජීවන අරමුණු මත කටයුතු කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 04 ක් ලියන්න. (ලකුණු 04)
   iii. විභාගය හොඳින් සමත් වීමට ඔබ විසින් ඉටු කළ යුතු කරුණු 04 ක් ලියන්න. (ලකුණු 04)

03. i. සමාජයේ පවත්නා හිතකර බලවේග 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)
   ii. පුද්ගලයාගේ දියුණුවට බාධා කරන අහිතකර සමාජ බලවේග 04 ක් ලියන්න.
   (ලකුණු 04)
   iii. හිතකර සමාජ බලවේග තුළින් පුද්ගලයාට ලැබෙන යහපත් ප්‍රතිඵල 04 ක් ලියන්න. (ලකුණු 04)

04. i. පුද්ගලයාගේ සංවර්ධනයට උපකාරීවන සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 02ක් ලියන්න.(ලකුණු 02)
   ii. ක්‍රීඩාවෙහි නිරත වීම තුළින් ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න. (ලකුණු 04)
   iii. අභියෝග ජය ගැනීමට ඔබ තුළ වර්ධනය විය යුතු ගුණාංග 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

05. i. ජන සමාජය යනු කුමක්ද? (ලකුණු 02)
   ii. ජන සමාජය තුළ අන්තර් සම්බන්ධතා පවතින ආකාර 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
   iii. ජන සමාජය තුළ පවත්නා සංවිධාන 03 ක් නම් කර ඒවායින් සමාජයට ඉටු වන කාර්යයන් 02 ක් ලියන්න.
   (ලකුණු 05)

06. i. දත්ත හා තොරතුරු සපයා ගත හැකි මුලාශ්‍ර 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. දත්ත හා තොරතුරු වල අවශ්‍යතාවය කරුණු 03 කින් ලියා දක්වන්න. (ලකුණු 03)

iii. ජීව දත්ත සටහනක ඇතුළත් විය යුතු කරුණු 05 ක් ලියන්න. (ලකුණු 05)

07. i. පුරවැසි අයිතිවාසිකම් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02)

ii. පුරවැසියෙකුට හිමි වන අයිතිවාසිකම් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

iii. අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉටු කළ යුතු යුතුකම් 05 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

08. i. ජන සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මුහුණ දෙන අභියෝග 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. අභියෝග ජය ගත හැකි ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

vi. යුතුකම් හා වගකීම් ඉටු කිරීම සමාජ සංවර්ධනයට හේතුවන්නේ කෙසේද? කරුණු 03 ක් ලියා එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

09. i. පවුල් ඒකකයක් තුළ ඥාති සම්බන්ධතා පවත්වා ගෙන යාම නිසා සාමාජිකයන්ට අයත්වන වාසි 02 ක් ලියන්න.
(ලකුණු 02)

ii. පුංචි අම්මා සීදේවී

අතේ වළල්ලක් දාවී

......................................

......................................

මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

iii. අසල් වැසියන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 03 ක් දක්වන්න (ලකුණු 03)

vi. වැඩිහිටියන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ජන සමාජය ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් සඳහන් කරන්න.

(ලකුණු 03)